# සියොතුන් සමනලුන් ගොවි බිමට කැන්දන
# කාබනික ගොවිතැන


**ඒ. රත්නසිරි**

*සංඛ්‍යාන සහකාර*

**කෘෂිකාර්මික හා පාරිසරික සම්පත්**

**කළමනාකරණ අංශය**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු

පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


**ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය වසර දෙදහස් පන්සියයක් (2500) පමණ දිගු අතීතයකින් හෙබි ය. අප සතුව පැවති කෘෂිකර්මය, තිරසාර පාරම්පරික කෘෂි පද්ධති වලින් නිර්මිත වූවකි. මේවා වී ගොවිතැන, හේන් වගාව සහ පාරම්පරික ගෙවතු වලින් යුක්ත විය. මෙහි දී හිතකර දේශගුණික තත්ත්වයන් සහ එම පරිසරයේ පැවති ඉහළ ජෛව විවිධත්වයන් ප්‍රතිලාභයන් ලෙස යොදා ගන්නා ලදි.**

හරිත විප්ලවයත් සමඟ සංවර්ධිත රටවල්, ලෝකයට බොහෝ දේවල් දායාද කොට දී තිබුණි. ආහාර බෝග ගැන සැලකූ විට, වැඩි අස්වනු ලබාදෙන වැඩි දියුණු කල ප්‍රභේද සහ දෙමුහුන් ප්‍රභේද මේවා අතර කැපී පෙනෙන ලෙස ඉදිරියෙන් තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඒකක බිමකින් ලබාගත හැකි අස්වැන්න පැහැදිලි ලෙස වැඩිකර ගත හැකි විය. සැබවින්ම, මෙය මහත් භාග්‍යයකි. එමෙන්ම, ලෝක ආහාර අර්බුදය සඳහා නව විසඳුමකි. මෙම ක්‍රමය තුලද සංකූලතා මතු වෙමින් පවතී.

මහජන චීන නිර්මාතෘ **මාඕ සේතුං** වරක් පවසා ඇති පරිදි සෑම විසඳුමක්ම ඊට අවේනික වූ ගැටළු සමඟ බැඳී පවතී.

හුදෙක් අස්වැන්න වැඩිවීම භාග්‍යයක් වුව ද, මේ සඳහා අධික ලෙස පොහොර හා කෘෂි රසායන භාවිතා කල යුතු විය. එමෙන්ම, ක්‍රමයෙන් පලිබෝධ නාශක වලට ප්‍රතිරෝධී කෘමි හා පලිබෝධයන් බිහි වීමත්, මෙම කෘෂි රසායන ජලය සමඟ සේදී ගොස් පහළ මිටියාවත් වල සහ ජලාශ වල රැඳීම නිසා පස හා ජලය දූෂණය වැනි අළුත් පාරිසරික ප්‍රශ්න මතු වී තිබේ.

සැබැවින්ම, මෙම ආහාර බෝගවල නිෂ්පාදනයන් හොඳ පෙනුමකින් යුක්ත වූ නිසා ඒ සඳහා යහපත් පාරිභෝගික ඉල්ලුමක් පැවතිනි. නව ද, දැන් දැන් මේවායේ ගුණාත්මක තත්ත්වය පිළිබඳව ගැටළු මතු වී තිබේ. දියුණු රටවල ඇතැම් කෘෂි රසායන භාවිතය පවා තහනම් කොට තිබේ.

මෙලෙස හරිත විප්ලවයෙන් දායාද කොට දුන් අහිතකර ප්‍රතිඵල පිටුදැකීම පිණිස විකල්ප මාර්ග සොයමින් සිටි ගොවීන් නැවතත්, තම පැරණි පාරම්පරික ගොවිතැන් ක්‍රම වෙත ක්‍රම ක්‍රමයෙන් පිවිසෙමින් සිටී.

වර්තමානයේ ලොව පුරා කාබනික ගොවිතැන ව්‍යාප්ත වෙමින් පවතී. මේ යටතේ ඇති වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් මිලියන 23 පමණ වේ. මෙම බිම් ප්‍රමාණයෙන් ආසියාවේ පවතින බිම් ප්‍රමාණය 2.6% කි. මෙයින් ශ්‍රී ලංකාවට හිමිවන්නේ 0.08% තරම් සුළු අගයකි. මෙරට එළවළු, පළතුරු, කුළුබඩු සහ තේ වැනි වගාවන් තුල කාබනික වගා ක්‍රමය සුළු වශයෙන් ව්‍යාප්ත වී තිබේ.

මෙම ගොවිතැන් ක්‍රමය වර්තමානයේ නවතාවයකින් කථා - බහ කෙරුන ද, මෙහි මූලික සංකල්ප ආදි ගොවීන් යොදාගත් සාම්ප්‍රදායික හරයන් ය.

ඇත්තෙන්ම පැරකුම් රජ දවස, රට සහලින් ස්වයං පෝෂිතව පෙරදිග ධාන්‍යාගාරය බවට පත් වූයේ මෙම පාරම්පරික දැනුමේ පිටුබලයෙනි.

ගරු කිරීම, විශ්වාස කිරීම, සැලකිල්ල වැනි මූලික ගුණාංග කිහිපයක් සාම්ප්‍රදායික ගොවිතැනේ ප්‍රකටව පැවතියේය.

බෝග සිටුවීම සුබ වේලාවකට සිදුකල අතර එමඟින් වල් සතුන්ගේ හානිය අවම කර ගැනීමත්, අස්වැන්න වැඩිකර ගැනීමත් අපේක්ෂා කෙරුණි.

හිරු කිරණවල අදෘශ්‍යමාන ශක්තියක් ඇතැයි ඔවුන් විශ්වාස කල අතර එම නිසා, හිරු උදාව හිරු බැසීම සහ පවතින කාලසීමාව පිළිබඳව බෝග වගා කිරීමේ දී, සැලකිලිමත් වී ඇත.

රතු හා ඈත රතු ආලෝකය අතර අනුපාතය මල් පිපීම කෙරෙහි බලපාන බව නවීන විද්‍යාවෙන් ද තහවුරු කොට ගෙන තිබේ.

**කෘත්‍රිම රසායන ද්‍රව්‍ය භාවිතයෙන් තොරව, උපරිම කාර්යක්ෂමතාවයකින් කාබනික පොහොර යොදා ගනිමින්, ස්වාභාවික පරිසරයේ පවතින අන්තර් සම්බන්ධතා උපයෝගී කරගනිමින්, උසස් ගුණාත්මයෙන් යුත් සත්ත්ව හා බෝග නිෂ්පාදනය කිරීම, කාබනික ගොවිතැන ලෙස අර්ථ නිරූපනය කල හැකිය.**

කාබනික ගොවිතැන, ස්වභාව ධර්මයේ නීතින් අනුගමනය කරයි. මෙය ප්‍රධාන සංකල්ප තුනක් මත පදනම්ව ක්‍රියාකරයි.

i. ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම
ii. ක්ෂේත්‍රය තුල සෑම ද්‍රව්‍යයක්ම ප්‍රතිචක්‍රීකරණය කිරීම.
iii. දිගු කාලීනව පසෙහි හා පරිසරයේ තුලනය රැක ගැනීම

මෙම සංකල්ප රැක ගනිමින් කාබනික ගොවිතැනෙහි නියැලෙන ගොවීහු සිය ගොවිතැන් කටයුතුවල යෙදෙති. මේ සඳහා ඔවුන් අනුගමනය කළයුතු කෘෂිකාර්මික ක්‍රමවේදය උදක්ම පරිසරය බැඳුනු පරිසර හිතකාමී ක්‍රියාවලියකි. මේ යටතේ පහත, ක්‍රමෝපායයන් හඳුනා ගත හැකි ය.

## ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම

නූතන කෘෂිකාර්මික ක්‍රමවල ව්‍යාප්තියත් සමගම සීමිත ලක්ෂණයන් ගෙන් යුත් බෝග වර්ග කිහිපයක් වගා කිරීම හේතුවෙන් බොහෝ පරිසර පද්ධතිවල ජීවි විවිධත්වය සීමා වී තිබේ.

විවිධාකාර ලෙස පළිබෝධ නාශක භාවිතය ද ජෛව විවිධත්වය හායනයට විශාල ලෙස දායක වේ.

මෙලෙස පරිසරයෙන් ඉවත්වන්නේ, ස්වභාවික පරිසරයට හැඩගැසී තිරුපද්‍රිත වීමට ඉඩ තිබූ ජානයන් ය. එබැවින්, ඇතැම් විශේෂ නැතිවියැම් මඟින් පරිසර තුලනය වෙත බලපාන්නේ ඒ සෑම විශේෂයකටම **නියමිත කාර්ය නිකේතනයක්** ඇති (Functional Nitche) බැවිනි.

ඇතැම් ශාක සමහර රෝගකාරයන් විනාශ කරන විලෝපිකයන්ට වාසස්ථාන වන අතර තවත් ශාක විශේෂයක බලපෑම නිසා සමහර රෝග කාරක වල වර්ධනය මැඩ පවත්වනු ලැබේ.

එමනිසා, කාබනික ගොවිතැනේ දී බෝග වගා කිරීමේ දී සීමිත බෝග වර්ග කිහිපයක් මත රැඳී නොසිටින අතර වල් නාශනයේදීත්, පළිබෝධ නාශනයේදීත් ජෛව විවිධත්වය හැකි පමණ රැක ගත හැකි අයුරින් කටයුතු කරනු ලබයි.

## සුදුසු බෝග වගා ක්‍රමයක් තෝරා ගැනීම

මෙහි දී, ශෂ්‍ය මාරුව සත්ත්ව බෝග මාරුව, අතුරු බෝග වගාව, සමෝධාන ගොවිතැන වැනි පරිසරයට හිතකර වගා ක්‍රමයක් අනුගමනය කළ හැකි වේ.

වගා භූමියේ සාරවත් භාවය ගොඩනඟා ගත හැකි නැතහොත් කළමනාකරණය කළහැකි සාධක අතුරින්, වඩාත් හොඳින් යොදාගත හැකි සාධකය ලෙස **ශෂ්‍ය මාරුව** සැලකිය හැකි ය.

කාබනික ගොවිතැනේ සාර්ථකභාවය හෝ කඩා වැටීම වගා බිමෙහි පාංශු කළමනාකරණයත් දේශගුණික තත්ත්වයත්, උචිත අයුරින් ශෂ්‍ය මාරු ක්‍රමය යොදා ගැනීමත් මත බොහෝ දුරට රඳා පවතී.

ශෂ්‍ය මාරු ක්‍රමයේ දී කාලය හා අවකාශය අනුව තෝරාගත් විවිධ බෝග ගොවිපල තුල මාරුවෙන් මාරුවට ස්ථාපනය කිරීම සිදුකරනු ලබයි. මෙහි දී ආර්ථික බෝග සමඟ අනිවාර්යෙන්ම රනිල බෝග වගා කෙරේ.

නිවැරදි ශෂ්‍ය මාරු ක්‍රමයක් තුලින්, වල් පාලනය, පළිබෝධ හා රෝග පාලනය සිදු කිරීමේ හැකියාව ද පවතී.

විවිධ ගැඹුරකින් හා විවිධ පැතිරීම් රටා ඇති මූල පද්ධති සහිත බෝග ශෂ්‍ය මාරුවට ඇතුලත් කිරීම නිසා ගැඹුරු මුල් මඟින් පසේ ගැඹුරින් ඇති පෝෂක අවශෝෂණය කොට එම පෝෂක පස මතුපිටට රැගෙන ඒම සිදුකරනු ලබයි.

එමෙන්ම, එකම කුලයට අයත් බෝග නැවතත් එම බිම් කොටසට පැමිණෙන කාලය ශෂ්‍ය මාරුව මඟින් දීර්ඝ කළහැකි නිසා එම බෝග වලට විශේෂ වූ රෝග හා පළිබෝධ වලින් ඒවා ආරක්ෂාකර ගත හැකි ය.

## සුදුසු බෝගයක් තෝරා ගැනීම

මෙහි දී වගා කරන පරිසරයට වඩා ගැලපෙන එම පරිසර සාධක යටතේ හොඳ අස්වැන්නක් ලබාදෙන බෝග වර්ගයක් තේරීම වැදගත් ය. එමෙන්ම, ස්වයං බීජ නිෂ්පදනය මඟින් වගා කටයුතු කිරීම මෙම ගොවිතැනේ කැපී පෙනෙන ලක්ෂණයකි.

## නිරෝගී පැල භාවිතය

ඉහළ නිෂ්පාදනයක් ලබාගැනීම සඳහා හොඳ නිරෝගී පැල වලින් වගාව ආරම්භ කළ යුතුය. මෙහි දී, කෙටි නිරෝගී මූල පද්ධතියක් සහිත පැල ලබාගත හැක්කේ තවාන් දැමීම මඟිනි.

තවාන් පාත්තියේ ඇති රෝග කාරක, ක්ෂුද්‍ර ජීවීන් හා වල් බීජ මර්ධනයට පස ජීවාණුහරණය කිරීම වැදගත් ය. මේ සඳහා නටන උණු වතුර යෙදීම, පිලිස්සීම වැනි ක්‍රම භාවිතා කළ හැකි වුව ද, සූර්යා ලෝකය යොදා ගනිමින් පස ජීවාණුහරණය කිරීම වඩා උචිතය. එහි දී අහිත කර ක්ෂුද්‍ර ජීවීන් පමණක් විනාශ වේ.

## සරු පස ආරක්ෂා කිරීම

පස පෝෂක අතින් පොහොසත් වන්නේ මතුපිට ඇති පස් තට්ටුවයි. ජලය, සුළඟ හා සත්ත්ව ක්‍රියාකාරකම් නිසා මෙම මතුපිට පස වගා බිමෙන් ඉවත් වී නිසරු බවට පත් වේ. එම නිසා, සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රමයක් වගා බිමෙහි අනුගමනය කළ යුතුය.

## වල් පාලනය

වගා බිමෙහි වල්පැලෑටි සහමුලින් උපුටා දැමීමක් මෙහි දී අපේක්ෂා නොකරන අතර වල්පැලෑටි ගහන ඝනත්වය, ආර්ථික හානිදායී මට්ටම අභිබවා නොයන ලෙස පාලනය කිරීමක් සිදු කෙරේ.

ගුණාත්මයෙන් යුතු බීජ තෝරා ගැනීම හා ක්ෂේත්‍රයේ සනීපාරක්ෂාව තහවුරු කර ගැනීමෙන් වගා බිමට වල්පැලෑටි පැමිණීම වලක්වා ගත හැකිය.

බිම් සකස් කිරීම, වසුන් භාවිතය, අතින් ඉදිරීම, ජලයෙන් යටකිරීම වැනි ක්‍රම මෙන්ම ඒකාබද්ධ වල් මර්ධනය ද භාවිතයට ගත හැකි වේ. වසුන් භාවිතය නිසා වල් මර්ධනය මෙන්ම ක්ෂේත්‍රයට කාබනික ද්‍රව්‍ය එකතුවීම ද සිදු වේ.

එමෙන්ම, කුරුල්ලන්, කෘමීන්, දිලීර, බැක්ටීරියා සහ වෛරස් වැනි ජීව විද්‍යාත්මක ක්‍රම ද මේ සඳහා භාවිතයට ගැනේ.

## රෝග හා පලිබෝධ පාලනය කිරීම

මෙහිදී වුවද පලිබෝධකයින් සමූල ඝාතනය කිරීමක් අපේක්ෂා නොකෙරේ. හොඳ බෝග වගා ක්‍රමයක් තෝරා ගැනීම, පලිබෝධකයින්ගේ ජීවන චක්‍රයේ අවස්ථා ගැන හා හානිදායක අවධීන් පිළිබඳව අවබෝධයක් තිබීම මඟින් මෙම රෝග හා පලිබෝධ වලින් වගාවට හානිවීම වලක්වා ගත හැකි ය. උදා: එළුණු වලින් නිකුත් කරන රසායනිකයකට සමනලයින් කැමති නැත. එම නිසා, එළුණු සමඟ ගෝවා එකට වගා කිරීමෙන් ගෝවාවල පතු හානිය වලක්වා ගැනීමේ හැකියාව ලැබේ.

ශෂ්‍ය මාරුව තුල උචිත කාලාන්තර වලින් බෝග ස්ථාපනය කිරීම මඟින් එක් බෝග විශේෂයක් මත පමණක් යැපුනු විශේෂිත කෘමීන් ආහාර නොමැතිවීම නිසා විනාශයට පත් වේ.

එමෙන්ම, පලිබෝධ ගණනාවක් සඳහා කොහොඹ ශාක සාරය, දුම්කොළ යුෂ, අළු මිශ්‍රිත වතුර ආදිය යොදා ගත හැකිය.

ආලෝක උගුල් ඇටවීම, පැල වටා ආවරණ දැල් යෙදීම, තැනින් තැන කනු සිටුවා ඒ මත කුරුල්ලන් සඳහා ආහාර තැබීම මඟින් ද පලිබෝධ මර්ධනය කල හැකි වේ.

## කාබනික පොහොර

මෙම වගා ක්‍රමයේ දී, වගා බිමේ පසෙහි සාරවත් භාවය කළමනාකරණය කිරීමේ මූලික මූලධර්මය වන්නේ, ඒ සඳහා යොදාගනු ලබන්නේ ජෛවීය ලෙස ලබාගන්නා පෝෂක ද්‍රව්‍යයන්ය. තව ද, පහසුවෙන් දියවන, ක්ෂණිකව ශාකයට ලබාගත හැකි පෝෂක ද්‍රව්‍ය වෙනුවට ක්‍රමානුකූලව පෝෂක ද්‍රව්‍ය නිකුත් කරන, සාපේක්ෂව විශාල ප්‍රමාණවලින් යුත් කාබනික ද්‍රව්‍ය භාවිත කරයි.

මෙම කාබනික පොහොරවල කාර්ය වන්නේ, පාංශු හිතකර ක්ෂුද්‍ර ජීවීන්ගේ ඝනත්වය වැඩි කිරීම තුලින්, පසෙහි භෞතික හා ජෛව රසායනික ලක්ෂණ දීර්ඝ කාලීනව හා ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගනිමින් ශාක වලට අවශ්‍ය පෝෂක ද්‍රව්‍ය ලබාදීමයි.

මෙහි දී, භාවිතා වන කාබනික පොහොර වශයෙන්, ගොවිපල පොහොර කොල පොහොර, කොම්පෝස්ට් පොහොර, කාබනික දියර පොහොර හා **පනුරෝපිත පොහොර** (Vermi Compost) හැඳින්විය හැකිය.

ගව, එළු, කුකුළු හා ඌරු මඩුවල ඇති සතුන්ගේ මල මූත්‍ර පිරි අතුරනු ගොවිපල පොහොරයි. මේවායේ සංයුතිය සත්ත්ව වර්ගය, සතුන්ගේ වයස, ලබාදෙන ආහාර ප්‍රමණය, මත විචලනය වේ.

එමෙන්ම, සත්ත්ව මල ආශ්‍රයෙන් ජීව වායු නිපදවන ටැංකිවල ඉතිරිවන අවක්ෂේපය කාබනික ශාක පෝෂක ලෙස භාවිතා කල හැක.

## කොල පොහොර

ශාකවල හරිතප්‍රද සහිත කොටස් කොල පොහොර ලෙස යොදා ගත හැක. මේ සඳහා **පිල, තෝර, කැප්පෙට්ටිය, වල්සූරියකාන්ත, එරබදු ගිනිසීරිය, ඉපිල් - ඉපිල් ශාක වල අතු මෙන්ම කව්පි, මෑ සහ රටකජු** වැනි බෝගවල අවශේෂ යොදා ගත හැක. මෙහි දී යොදා ගන්නා කොල පොහොර වල C/N අනුපාතය වැදගත් ය. මෙහි දී 50% මල් පිපෙන අවස්ථාවේදි අවම අනුපාතය ලබාගත හැකි වේ.

## කොම්පෝස්ට් පොහොර

ගොවිපල අපද්‍රව්‍ය, මුළුතැන්ගෙයි ඉවත ලන දෑ, නාගරික අපද්‍රව්‍ය වලින් වෙන්කර ගත් කාබනික ද්‍රව්‍ය සහ ගෙවත්තෙන් සොයා ගත හැකි අතු රිකිලි ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවලියක් තුලින් ජලයේ ද්‍රාව්‍ය සරල කාබනික ද්‍රව්‍ය බවට පත් කිරීම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ලෙස හැඳින්විය හැකි ය.

## වර්මි කොම්පෝස්ට්

ගැඩවිල් පනුවන් ආශ්‍රයෙන් පිළියෙල කරගන්නා කාබනික පොහොර, මෑත කාලයේ වඩා ජනප්‍රිය වූවකි. මෙම පොහොර ඝන හා දියර යන දෙයාකාරයෙන්ම පිළියෙල කර ගත හැකි වේ.

## කාබනික දියර පොහොර

මෙය තරමක් තැවුම් අත්දැකීමකි. මෙහි දී ශාක පත්‍ර වතුර සමඟ ආවරණය කල ටැංකියක දමා වසා තැබීමෙන්, ජලය ද්‍රාව්‍ය පෝෂක වර්ග ජලය තුලට තිසසාරණය කර ගැනීමක් සිදුවේ. මෙහි දී යොදාගනු ලබන ශාක පත්‍ර වර්ගය මත හා ප්‍රමාණය මත තබාගත යුතු කාලය වෙනස් වේ.

ප්‍රශස්ථ බෝග වර්ධනයක් සඳහා N.P.K. යන පෝෂක වර්ග අවශ්‍ය ප්‍රමාණ වලින් පැවතිය යුතුය. යම් පෝෂකයක් අඩුව පැවතීම හෝ වැඩියෙන් පැවතීම බෝගයේ අවසාන අපේක්ෂිත ප්‍රතිඵලය වන අස්වැන්න කෙරෙහි අයහපත් ලෙස බලපෑම් ඇති කරයි.

කාබනික ගොවිතැනේ දී නයිට්‍රජන් පෝෂණයේ අවශ්‍යතාව, කාබනික ද්‍රව්‍ය පසට එකතු කිරීමෙන් හා රනිල බෝග වගා කිරීම තුලින් **රයිසෝබියම** බැක්ටීරියා ආශ්‍රයෙන් ලබාදිය හැකි ය.

මෙහි දී, **පොස්පරස්** හා **පොටෑසියම්** පෝෂක ලබාදීම සඳහා ඇති කාබනික ප්‍රභවයන් සීමා සහිතය.

තව ද, ඇටකටු පොහොර පොස්පරස් පෝෂකය ලබාදීම සඳහා භාවිතා කල හැකි වේ. අතීතයේ ද අප රටෙහි කුඹුරු සඳහා ඇටකටු පොහොර භාවිත කොට ඇති බවට සාක්ෂි පවතී.

එමෙන්ම, **පොටෑසියම්** ලබාදීම සඳහා පිදුරු භාවිතා කල හැක. මෙහිදී බොහෝ ගොවීහු මෙම අගනා අවස්ථාව පැහැර හරිමින් පිදුරු ගිනි තැබීමට පුරුදුව සිටිති.

කුඹුරු අක්කරයකින් අස්වැන්න ලෙස වී බුසල් 60 ලබා ගත්විට පිදුරු ටොන් 1.2 විතර ලබාගත හැකිය. මෙහි N - 8-14 Kg, K 16-24 Kg පමණ ද, සිලිකා 72 Kg පමණ ද අඩංගුව පවතී.

කාබනික ගොවිතැනේ මූලික සංකල්ප වලට අනුව, අවශ්‍ය යෙදවුම් ගොවිපල තුලින් සපයා ගත යුතු අතර බාහිර යෙදවුම් ලබාගැනීම නොකල යුතුය.

තව ද, කෘත්‍රිම පොහොර භාවිතය තහනම් කොට තිබේ. එසේ වුව ද, ස්වභාවික නිධි ආශ්‍රයෙන් කැනීම් මගින් ලබා ගන්නා ඛණිජ පෝෂක, භාවිතය සඳහා අවසර ලබා දී තිබේ.

මෙහි දී, ඛණිජ පෝෂක භාවිතා කිරීම, අවශ්‍ය පෝෂක ද්‍රව්‍ය ප්‍රතිස්ථාපනය කිරීමක් නොවන අතර එය පරිපූර්ණ කිරීම සඳහා දරන ප්‍රයත්නයකි. එනම් බෝගයේ පෝෂක අවශ්‍යතාව උචිත ශෂ්‍ය මාරු ක්‍රමයක් මගින් හෝ යොදන කාබනික ද්‍රව්‍ය මගින් සපුරා ගත නොහැකි විට ඛණිජ පෝෂක භාවිත කරනු ලබයි.

මේ සඳහා අදාල කාබනික වගාව සහතික කරන ආයතනය මගින් අවසර ලබාගත යුතු වේ. මෙහි දී, **රොක් පොස්ෆේට්, රොක් මැග්නීසියම්, කනින ලද පොටෑසියම් ලවන,** භෞතික ක්‍රම වලින් ලබාගන්නා පොහොර (ද්‍රාව්‍යතාව වැඩි කිරීම සඳහා රසායනික ක්‍රම යොදා නොගත්) කාබනික වගාවේ දී භාවිත වේ.

IFOAM විසින් කාබනික ගොවිතැනේ දී භාවිත කරන යෙදවුම් ඇගයීම සඳහා අවශ්‍ය **මිනුම් දඬු** (Critoria) සකසා තිබේ.

**ඇමරිකා එක්සත් ජනපදයේ** (U.S.A) OMRI (Organic Material Review Institute) විසින් කාබනික ආහාර කෙදි නිෂ්පාදනයේ දී භාවිතා කිරීමට අවසර දෙන හා තහනම් ද්‍රව්‍ය පිළිබඳ ප්‍රකාශ නිකුත් කරනු ලබයි. මෙම ආයතනය මගින් භාවිත කලහැකි **පොටෑසියම්** පොහොර ලෙස නම් කර ඇත්තේ පිළියම් නොකල පොටෑසියම් ක්ලෝරයිඩ් (Kcl) හා කෘතිම නොවන පොටෑසියම් සල්ෆේට් ($K_2So_4$) ලවනයන්ය. මෙම ($K_2So_4$) ඇමරිකාවේ ස්වාභාවික ලවන ජලය සහිත ජලාශයකින් (US Great Salt Lake) ලබා ගනී.

**ඊශ්‍රායලය** සැලකූ විට මල මුහුදේ ජලය, KCL පෝෂක වලින් පොහොසත්ය. ඔවුන් මෙම ස්වාභාවික සම්පත කාබනික ගොවිතැන සඳහා භාවිතා කරනු ලබයි.

මෙම පොටෑසියම් පෝෂකය පැහිරි, ඇපල්, කපු, ඉරිඟු, අර්තාපල්, තක්කාලි, කැකිරි වැනි ක්ෂේත්‍ර බෝග සඳහා භාවිත කරනු ලබයි.

දේශීය වශයෙන් සැලකූ විට පළතුරු වගාව කුළුබඩු වගාව මෙන් තේ වගාව වැනි බහු වාර්ශික බෝග සඳහා කාබනික ගොවිතැනේ **එප්පාවල රොක් පොස්ජේට්** භාවිත කරනු ලබයි.

සමස්ථයක් වශයෙන් කාබනික වගාව යනු හුදෙක් කෘතිම රසායන ද්‍රව්‍ය නොයොදා බෝග වගා කොට වස විෂ වලින් තොර එලනෙලා ගැනීම පමණක් අරමුණු කොට නොගන්නකි. පසෙහි සරුබව වැඩිකර ගැනීම සඳහාත්, පරිසරය සුරකීම සඳහාත් අනුමත කරන ලද කාබනික හා සෙසු ස්වාභාවික ද්‍රව්‍ය භාවිතාකර, තිරසාර කෘෂිකාර්මික ක්‍රම ගොඩ නැඟීම ද මෙයට අදාළ වූවකි. මෙලෙස අඛන්ඩව කාබනික වගාවේ නියැලීමෙන් පසෙහි සරුබව වර්ධනය පමණක් නොව සමස්ථ පරිසර තත්ත්වයන් උසස් කර ගැනීමට ද හැකියාව ලැබෙයි.

එවිට, එම පසෙහි බිම පනුවෝ නැවතත් දැකිය හැකි වේ. කටුස්සන් සහ කුඩා සතුන් භූමියට නැවතත් පැමිණේ. සියොතුන් හා සමනලුන් ඔබ මොබ සැරි සරයි. මේ අනුව කාබනික ගොවිතැනක දැක්ම විය යුත්තේ මෙම සමස්ථ ක්‍රියාවලියේ ගමන් මගයි.